# පරිසර නියමු ජනාධිපති පදක්කම් ලාභීන්ගේ

# ඉන්දීය සංචාරය



එච්.ඩී. ජයසිරි
විදුහල්පති
ශ්‍රීපාලි විද්‍යාලය - හොරණ

# පටුන


1. විදේශ අධ්‍යාපන චාරිකාව සඳහා එක්වූ 01

   කණ්ඩායමේ සාමාජික නාම ලේඛනය.

2. ඉන්දීය අධ්‍යන චාරිකාව වැඩසටහන් විස්තරය.

3. **NIIT** විශ්ව විද්‍යාලය නිම්රනා පළමු නැරඹුම් ස්ථානය.

4. **Anil Agruwal Enviroment Training Institute Rajasthan.**

5. රෝහල් හා සායනික අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය.

6. **Whyte Organic** සත්ව ගොවිපොළ නැරඹීම.

7. ටාජ් මහල් අග්‍රා නගරය.

8. දිල්ලි උමං දුම්රිය කෞතුකාගාරය.

9. ඉන්දීය පරිසර අමාත්‍යාංශය **(Paryavaran Bhawan).**

10. **IGI** ගුවන් තොටුපල .

<u>**විදේශ අධ්‍යාපන චාරිකාව සඳහා එක්වූ 01 කණ්ඩායමේ**</u>

<u>**සාමාජික නාම ලේඛනය**</u>

- නායක - සුනිල් උඩුකල මහතා
  අධ්‍යක්ෂක
  පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරිමේ අංශය

- උප නායක - එම්.ඩී.ජයසිරි
  විදුහල්පති
  ශ්‍රීපාලි විද්‍යාලය - හොරණ

- සාමාජිකයින් -
  1. ටී.එම්.ජී.දිවංග විශ්මජිත් බණ්ඩාර
     ශ්‍රීපාලි විද්‍යාලය
  2. එම්.එන්.එච්.ඉමාෂා මාධවී
     ශ්‍රීපාලි විද්‍යාලය
  3. යෙෂිකා තරින්දි මුණසිංහ
     ශ්‍රීපාලි විද්‍යාලය
  4. යු.කේ.ශාමික ඉමන්ත
     රිච්මන්ඩ් විද්‍යාලය
  5. කේ.ජී. විහන්ග සත්සර
     බෝධිමළුව විද්‍යාලය



# ශ්‍රී ලංකා අධ්‍යයන චාරිකාව

# 2019 සැප්තැම්බර් 15 සිට 21 දක්වා

# වැඩසටහන් විස්තරය

| දිනය | වේලාව | වැඩසටහන |
|---|---|---|
| **2019.09.15** | ප.ව **8.00** | නවදිල්ලියට ලඟාවීම හා නවාතැන සිල්වර් ෆෙන්ස් හෝටලය, දිල්ලිය. |
| **2019.09.16** | පෙ.ව **6.30 - 7.15** | උදෑසන ආහාරය |
| | පෙ.ව **7.15 - 7.30** | නීම්රනා NIIT විශ්වවිද්‍යාලයට යාම සඳහා බස්රථයට ගොස් සූදානම් වීම. |
| | පෙ.ව **10.30 - 12.30** | NIIT නිම්රනා විශ්ව විද්‍යාලය නැරඹීම |
| | ප.ව **12.30** | රාජස්ථාන නිම්ලි පිහිටි **AAETI** ආයතනය වෙත යාමට සූදානම්වීම |
| | ප.ව **2.30 - 4.00** | දිවා ආහාරය **- AAETI** ආයතනය |
| | ප.ව **4.00 - 4.15** | ඉන්දීය විද්‍යා හා පරිසර මධ්‍යස්ථානය පිළිබඳ හැඳින්වීම |
| | ප.ව **4.15 - 5.00** | **AAETI** සංචාරය **- DWWTS** |
| | ප.ව **5.00 - 5.30** | ඉන්දීය විද්‍යා හා පරිසර ආයතනය විසින් පාරිසරික අධ්‍යාපන ඒකක සහ හරිත පාසල් වැඩසටහන පිළිබඳ සාකච්ඡා කිරීම |
| | ප.ව **5.30 - 7.00** | විවේක කාලය |
| | ප.ව **7.00** සිට | සංස්කෘතික සන්ධ්‍යාව හා රාත්‍රී ආහාරය **- AAETI** ආයතනය |
| **2019-09-17** | පෙ.ව **7.30 - 8.15** | උදෑසන ආහාරය **- AAETI** ආයතනය |
| | පෙ.ව **8.00** | රාජස්ථාන **HOSWIN** ජෛව විද්‍යා අපද්‍රව්‍ය දහන මධ්‍යස්ථානය වෙත යාමට සූදානම්වීම |
| | පෙ.ව **7.30 - 8.15** | රාජස්ථාන **HOSWIN** ජෛව විද්‍යා අපද්‍රව්‍ය දහන මධ්‍යස්ථානය නැරඹීම |
| | ප.ව **12.00 -12.15** | **AAETI** ආයතනය වෙත නැවත යාමට සූදානම් වීම |
| | ප.ව **1.30 - 2.30** | දිවා ආහාරය **- AAETI** ආයතනය |
| | ප.ව **2.30 -2.45** | **WHYTE ORGANIC FARMS** නැරඹීමට යාම සඳහා සූදානම් වීම |

| | | |
|---|---|---|
| | ප.ව 3.30 - 4.30 | **WHYTE ORGANIC FARMS** නැරඹීම |
| | ප.ව 4.30 | **AAETI** ආයතනය වෙත නැවත යාමට සූදානම් වීම |
| | ප.ව 7.30 | රාත්‍රී ආහාරය - **AAETI** ආයතනය |
| **2019.09.18** | පෙ.ව 5.30 - 6.00 | සූදානම්වීම හා උදෑසන ආහාරය |
| | පෙ.ව 11.00 - 2.30 | **TAJ MAHAL** නැරඹීම |
| | ප.ව 3.00 - 4.00 | දිවා ආහාරය |
| | ප.ව 8.00 | නව දිල්ලියට ලඟාවීම - රාත්‍රී ආහාරය **SIVER FANS** හෝටලය |
| **2019-09-19** | ප.ව 8.00 - 8.45 | උදෑසන ආහාරය |
| | ප.ව 10.30 -12.30 | **EDMC** ගොඩනැගිලි ඉදිකිරිම හා විනාශකිරිමේ අපද්‍රව්‍ය පරිශ්‍රය නැරඹීම |
| | ප.ව 12.30 | දිවා ආහාරය සඳහා පිටත්ව යෑම |
| | ප.ව 1.30 - 2.30 | දිවා ආහාරය |
| | ප.ව 2.30 | **DMRC** කෞතුගාරය වෙත යාමට සූදානම් වීම |
| | ප.ව **3.10- 4.30** | **DMRC** කෞතුගාරය නැරඹීම |
| | ප.ව 4.30 | නවාතැනට නැවත පැමිණිම හා රාත්‍රී ආහාරය |
| **2019.09.20** | පෙ.ව 7.30-8.00 | උදෑසන ආහාරය |
| | පෙ.ව 9.00 -12.00 | **ASOLA BHATTI** වනජීවී අභයභූමිය නැරඹීම |
| | ප.ව 12.00 | ඉන්දීය විද්‍යා හා පරිසර මධ්‍යස්ථානය වෙත නැවත පිටවීම |
| | ප.ව 12.30 -2.00 | දිවා ආහාරය හා සහතික පත්‍ර ප්‍රදානය ,කණ්ඩායම් ඡයාරූප ගැනීම |
| | ප.ව 2.00 | **PARYAVARAN BHAWAN ,MMOEFCC** සඳහා පිටත්වීම |
| | ප.ව 3.00 - 4.00 | **PARYAVARAN BHAWAN ,MMOEFCC** සංචාරය හා **Q & A** සැසිය |
| | ප.ව 4.00 | විවේකය |
| **2019.09.21** | ප.ව. 12.30 - 1.00 | **IGI** ගුවන්තොටුපොල දක්වා පිටත්වීම |

පළමු දිනය :- 2019.09.16

නැරඹුම් ස්ථානය :- NIIT විශ්ව විද්‍යාලය නිම්රනා

විශේෂිතාවය :-

❖ ශාක ආශ්‍රිතව පවතින පිරිසිදු වාතය පෙරීම තුලින් පිරිසිදු කර ගොඩනැගිලිතුලට ඇතුළු කිරිම






❖ අපට ලබාගත හැකි ආදර්ශයන්

1. කැලයේ තිබෙන පිරිසිදු වාතය අඩු වියදමකින් භාවිතයට ගැනීම.
2. දිනපතා වියදම අඩුවීම.
3. අඩු යන්ත්‍ර සූත්‍ර භාවිතය.
4. ස්වභාවික වාතය භාවිතා කිරීම.
5. නඩත්තුව අවම වීම.
6. ස්වාභාවික පිරිසිදු වාතය භාවිතය මගින් ශරීර සෞඛ්‍යය සුරැකීම.

- **විශේෂිතාවය** :- ස්වභාවික සූර්යා ලෝකය ගොඩනැගිලි තුල භාවිතය



- **අපට ලබාගත හැකි ආදර්ශයන්**
  1. ස්වාභාවික ආලෝකය භාවිතය
  2. විදුලි බිල අඩුවීම
  3. උපකරණ වියදම අඩුවීම
  4. මහල් ගොඩනැගිලිවල තට්ටු අතරද වාතය හුවමාරු වීම
  5. ස්වභාවික සූර්යා ලෝකය භාවිතය නිසා ශරිර සෞඛ්‍යය රැකීම

දෙවෙනි නැරඹුම්

ස්ථානය :- **Anil Agruwal Environment Training Institute , Nimli,Rajasthan**

විශේෂිතාවය :-

❖ **ස්වාභාවික වශයෙන් ජල පිරිපහදු පද්ධතියක් යොදා ගනී.**






වැදගත්කම :-

- ❖ මෙම ආයතනයේ පරිහරණය කෙරෙන අපජලය පිරිපහදු කිරීම සඳහා ස්වාභාවික ක්‍රමවේදයක් යොදා ගනී
- ❖ මෙම ආයතනයේ ප්‍රධාන වශයෙන් ගොඩනැගිලි 03 පවතී. එනම් නේවාසිකාගාරය ,දේශන ශාලාව හා මුළුතැන්ගෙය
- ❖ මෙම ගොඩනැගිලි අතරින් නේවාසිකාගාරයන් හා දේශනශාලාවෙන් පිටවන ජලය RAN WATER COLLECTION TANK එකකට යොමු කරයි.
- ❖ මුළුතැන්ගෙයි පවතින ජලය OIL AND GREASE TRAP අඩංගු ටැංකියකට යොමු කරන්නේ එහි තෙල් ස්වාභාවයක් පැවතිය හැකි නිසාය.
- ❖ පසුව ටැංකි 03 ක තුළින් පිරිපහදු වන අපජලය පසුව එම ටැංකියට එකතුවේ. අනතුරුව ගල් ස්ථර කිහිපයක් තුලින් එම ජලය බැසයයි.
- ❖ ඉන් අනතුරුව canna indica ශාකය රෝපනය කර ඇති ටැංකියකට එම ජලය යොමුකර තවදුරටත් එම ජලයේ පවතින බැර ලෝහ ඉවත් කරයි. මෙම ශාකවලට බැර ලෝහ අවශෝෂණය කරගැනීමට හැකියාවක් පවතී.

**දෙවන දිනය**     **:-**     **2019.09.17**

නැරඹුම් ස්ථානය     :-     රෝහල් හා සායනික අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය
රාජස්ථානය

**විශේෂිතාවය**     **:-**

- ❖ රාජස්ථාන් ප්‍රදේශයේ අවට ඇති රෝහල් හා සම්බන්ධවී ඒවායේ ඇති රසායනික අපද්‍රව්‍ය ක්‍රමවත් ලෙස ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා මිනිසාට හානියක් නොවන අයුරින් විශේෂිත බහාලුම්වලට එකතු කරනු ලබයි.

- ❖ එම අපද්‍රව්‍ය විශේෂිත බොයිලේරුවක් මගින් පරිසරයට හානියක් නොවන සේ අධි තාපයෙන් පුලුස්සා දැමීම සිදු කෙරේ.



**අපට ලබාගත හැකි ආදර්ශයන් :-**

- ❖ **ජීවින්ට හිතකර ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම**
- ❖ **විවෘත ලෙස භාවිතවට ගනු ලබන ක්‍රියාවලියක් වීම**
- ❖ **මෙමගින් දෙවන අදියරයන් තුළ පරිසර දූෂණයන් වීම වැලැක්වීම**
- ❖ **සුළු ක්‍රියාවලියක් වීම**

දෙවෙනි  නැරඹුම්

ස්ථානය :- **WHYTE ORGANIC** සත්ව ගොවිපොළ නැරඹීම

විශේෂිතාවය :-

- ❖ කොළපාට තණකොළ ගසක්වත් නොමැතිව කිරි එළදෙනුන් නඩත්තු කිරිම
- ❖ කිරිපිටි නිශ්පාදන නොකර කල් තබාගන්නා දියර කිරි පමණක් නිශ්පාදනය
- ❖ තිරිඟු හා ආහාර නිශ්පාදන ද්‍රව්‍යවල බැහැර වන ශාක කොටස් කැලි කර සතුන්ට ලබා දී සතුන් නඩත්තු කිරීම සිදුකරයි. එබැවින් ආහාර සඳහා යන වියදම අවම කර ගනිමින් කිරි නිශ්පාදනය සිදුකරයි.





තෙවන දිනය :- **2019.09.18**

නැරඹුම් ස්ථානය :- ටාජ් මහල - අග්‍රා නගරය

විශේෂිතාවය :-

❖ මෙම ටාජ් මහල් මන්දිරය පිහිටා ඇත්තේ ඉන්දියාවේ අග්‍රා නගරයේ වන අතර මෙය ඉන්දීය ජනතාව තුළද, මහත් ආකර්ශනයක් උත්පාදනය කළ ස්ථානයකි.

❖ මෝගල් අධිරාජායේ ප්‍රබල සාමාජිකයෙකු වන සාජහන් විසින් තම ආදරණිය බිරිඳ මුන්ටාස් මහල් සඳහා මෙම මන්දිරය නිර්මාණය කොට ඇති අතර මෙය භාරතීය සමාජයේ ආදරයේ ජීවමාන සංකේතයක් ලෙස සලකනු ලබයි.

❖ ඒ අනුව ඉතාමත් අලංකාර ලෙස නිර්මාණය කර ඇති මෙම මන්දිරය තුළ කිරිගරුඬ කැටයම් රාශියක් දැකගත හැකි අතර ඒවා ඉතා අලංකාර ලෙස නිමවා ඇත.



- තවද මුනටාස් මහල් දේවියගේ මෙන්ම ඉන් පසුව මියගිය සාජහන් රජුගේද සොහොන් කොත් මෙම මන්දිරය තුළ දැකගත හැක. සාජහන් කොතරම් ආදරයකින් මෙම මන්දිරය ඉදි කළද, අවසන් කාලයේ මෙහිම සිරකරුවෙකු වී මිය යාමට ඔහුට සිදුවිය.

- කෙසේ වෙතත් අද වන විට විශාල දෙස් විදෙස් සංචාරකයින් පිරිසකගේ සිත් ඇදගත් මන බඳිනා සොඳුරු සිහිවටනයක් බවට ටාජ් මහල් මන්දිරය පත්ව ඇත.

- යුනෙස්කෝ ලෝක උරුම සංවිධානය විසින් 1983 වර්ෂයේ දී මෙය ලෝක උරුමයක් බවට ප්‍රකාශ කොට ඇත.



**සිව්වන දිනය** **:-** **2019.09.19**

**නැරඹුම් ස්ථානය** **:-** **දිල්ලි උමං දුම්රිය කෞතුගාරය**

**විශේෂිතාවය** **:-**

- ❖ මෙය දිල්ලි ප්‍රාන්තයේ ප්‍රවාහන සේවාවට ඉතා ඉහළ දායකත්වයක් සපයන උමං දුම්රිය සේවාවකි.

- ❖ මෙම කෞතුකාගාරය උමං දුම්රිය සේවාවේ අතීතය සම්බන්ධව අපට මනාව වටහා ගැනීම උපකාරි විය.

- ❖ දැනට දිල්ලි ප්‍රාන්තයේ ප්‍රවාහනය උදෙසා උමං දුම්රිය 09 ක් සේවා වේ යොදවා ඇති අතර දිනකට එමගින් සේවය ලබාගන්නා ජනගහනය ඉතා ඉහළ අගයක් ගනී.

- ❖ මෙම දුම්රිය තුන් ආකාරයකින් ගමන් කරයි.එනම් උමං මාර්ගයෙන්, සාමාන්‍ය ස්වාභාවික පරිසරය හා කණුමත ආදී වශයෙන් මෙම දුම්රිය තම ගමනාන්තයට ළඟාවේ.

- ❖ එලෙසම මෙහි වන විශේෂත්වය වන්නේ මෙම දුම්රිය සේවාවෙන් කිසිම ලෙසක පරිසරයට හානියක් නොවීමයි. එනම් මේවා ගමන් කිරීමේ දී පරිසරයට කිසිඳු කාබනික අපද්‍රව්‍යයක් එක් නොවන අතර දුම්රිය ගමනේ දී උත්පාදනය වන ශක්තිය චාලක ශක්තිය බවට පරිවර්තනය වී ඒවායේ ගමනට උපකාරී වේ.

- ❖ මෙම උමං දුම්රිය සේවය දැනට ආසියාවේ පවතින සැලකිය යුතු දියුණුවක් ලබාගෙන ඇති පද්ධතියක් වන අතර මෙම දුම්රිය රියදුරන් සහිත හා රියදුරන් රහිත ස්වයංක්‍රිය පාලනයෙන් යුතු දුම්රියන් ලෙස ධාවනය වේ.



**ප්‍රතිලාභ** **:-**

- ජනතාව ගේ ගමනාගමනය පහසුකරලීම.
- අනෙකුත් ප්‍රවාහන මාධ්‍ය වලට වඩා කාර්යක්ෂම වීම.
- අඩු කාලයක් තුල අවශ්‍යතා සපුරාගැනීමට ජනතාවට හැකිවීම.
- පරිසර දූෂණය අවම වීම.
- එක් වටයක් ධාවනය කිරීමේ දී නිකුත්වන ශක්තියෙන් ඊළඟ වටය ධාවනයට ශක්තිය උත්පාදනය කරගැනීම.

පස්වන දිනය :- **2019.09.20**

**නැරඹුම් ස්ථානය :- ඉන්දීය පරිසර අමාත්‍යාංශය (PARYAVARAN BHAWAN)**

**විශේෂිතාවය :-**

- ❖ අපගේ අවධානයට පාත්‍ර වුනු තවත් වටිනා ස්ථානයක් ලෙස ඉන්දීය පරිසර අමාත්‍යාංශය දැක්විය හැකිය.

- ❖ සත්මහල් ආයතනයක් වූ මෙය පර්යාවන් භවන් (**PARYAVARAN BHAWAN**) නම් අන්වර්ථ නාමයෙන් හැඳන්වෙන අතර මෙය ජල, පෘථිවි, අග්නි. වායු ආදි වශයෙන් වෙන් ඒකකයන්ගෙන් යුක්තවූ ආයතනයකි.

- ❖ මෙහි ඇති සුවිශේෂිතාවය වන්නේ මෙම අමාත්‍යාංශයේ ස්වාභාවික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගෙන තිබීමයි. එනම් මෙහිදී සූර්ය කෝෂ විශාල ප්‍රමාණයක් භාවිතා කරමින් බලශක්තිය නිපදවන ආකාරය අපට දැකගත හැකිවිය.



- ❖ මෙම ආයතනයේ වහලය සැකසීමට ඔවුන් සූර්ය කෝෂ උපයෝගී කොට ගෙන තිබූ අතර ඉන් ජනනය වන බලශක්තිය ආයතනයේ එදිනෙදා වැඩකටයුතු වලට සූක්ෂම ලෙස උපයෝගී කොට ගෙන තිබුණි.

❖ තවද මොවුන් සතුව ඉතා අගනා ස්වයංක්‍රීය බිම්මහල් වාහන අංගනයක් පැවතුණි.එහි වාහන 330 ක් පමණ එකවර නවතා තැබිය හැකි අතර සියලුම වාහන ස්වයංක්‍රීයව පාලනය කිරිමේ හැකියාවක් ඔවුන් සතුවිය.

❖ එලෙසම මොවුන් ආයතනයේ භාවිතා වන ජලය ප්‍රතිචක්‍රීකරණයට භාජනය කොට නැවත භාවිත කරනු ලබයි.

❖ ඒ ආකාරයට ගත්විට ඉන්දීය පරිසර අමාත්‍යාංශය ස්වාභාවික සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගන්නා ආයතනයක් ලෙස දැක්විය හැක.



ප්‍රතිලාභ :-

❖ ස්වාභාවික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගෙන ඇත.
❖ අඩු වියදමින් වැඩි ප්‍රතිලාභ ලබාගත හැක.
❖ ආයතනයේ වාර්ෂික වියදම අඩු කරගැනීම.
❖ කාර්යක්ෂමතාව ඉහළ නංවා ගැනීම.

පස්වන දිනය :- **2019.09.21**

නැරඹුම් ස්ථානය :- **IGI ගුවන් තොටුපෙළ**

විශේෂිතතාවය :-

- ❖ නැවත ලංකාවට පැමිණීම සඳහා IGI ගුවන් තොටුපළට පැමිණීම.

